**රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2019**

**-----------------------------------------------------**

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**--------------------------------------------------------------------------**

මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ දක්ෂිණ අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් නව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුළින් රටේ උපායමාර්ගික හා සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ආසන්න වශයෙන් රු.මිලියන 286,000 ක් වන අතර භාණ්ඩාගාර ලේකම්ගේ අධීක්ෂණය යටතේ දේශීය බැංකු පද්ධතියෙන් මූල්‍යයනය කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි.

**1.3 මතය**

**------**

මාගේ මතය,ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

**1.4 මතය සඳහා පදනම**

**--------------------**

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

**-------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා කිලෝමීටර් 73.9 ක අධිවේගී මාර්ගය ඉදිකිරීමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් 2016 අගෝස්තු 23 දින අනුමතකර තිබුණි. කෙසේවෙතත්, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මතු කරන ලද ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 31 තෙක් ආරම්භ කිරීමට අපොහොසත් වී ඇත. තවද, සියලු පූර්ව ගිවිසුම් අවලංගු කිරීමට

සහ දේශිය බැංකු මූලා පහසුකම් යටතේ දේශිය කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය 2020 ජූලි 01 දින තීරණය කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2020 සැප්තැම්බර් 30 දින වන විට කහතුඩුව සිට ඉංගිරිය දක්වා කිලෝමීටර් 24.3 ක් සඳහා ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කර තිබුණි.

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංක | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මතු කරන ලද ගැටළු හේතුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින වන විටත් ලබා ගත නොහැකිවී ඇත. කෙසේවෙතත්, මෙම වාර්තාව ලැබීමට පෙර ව්‍යාපෘතිය එහි කටයුතු වන මූලික සැලසුම් සකස් කිරීම, පූර්ව ලංසු ක්‍රියාවලිය සහ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ආරම්භ කර තිබුණි. | මාර්ගය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාදවීම සහ ව්‍යාපෘති පිරිවැය ඉහළ යාම සිදුවිය හැක. | මේ දක්වා පාරිසරික බලපෑම් ඇගයීමේ (ඊ.අයි.ඒ) ප්‍රගතිය සියයට 99 කි. | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මතු කරන ලද මූලික ගැටළු නිරාකරණය කිරීමට සහ අනුමැතිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ව්‍යාපෘතියේ ජල විද්‍යා අධ්‍යයනය සඳහා රු.මිලියන 66.44 ක පිරිවැයකට තෝරාගෙන තිබූ නමුත් එම පැවරුම සඳහා විධිමත් ගිවිසුමක් නොමැත. ප්‍රතිඵලයක් ලෙස, වසර 02 ක් ගතවී ඇතත් සංස්ථාව විසින් වාර්තාව සම්පූර්ණ කර | මාර්ගය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමේදී ප්‍රමාදයන් සිදු විය හැක. | සවිස්තරාත්මක ජල විද්‍යා අධ්‍යයනය සහ විෂය ක්ෂේත්‍රය, කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම සහ ඇස්තමේන්තු කිරීම අවසන් කිරීම වැනි එහි ගැටළු සමාලෝචනය සඳහා මහාමාර්ග අමාත්‍යාංශය විසින් තාක්ෂණික ඇගයීම කමිටුවක් (තා.ඇ.ක) පත්කර ඇත. | ප්‍රථමයෙන් පැවරුමේ කාලසීමාව සහ පැවරුමේ ඇස්තමේන්තු ගත පිරිවැය සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමක් අත්සන් කල යුතුය. |

නොතිබූ අතර රු.මිලියන 91.10 ක සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුවක් 2020 ජුනි 20 දින ඉදිරිපත් කර ඇත. වාර්තාව ඉදිරිපත් කිරිම ප්‍රමාද වීම ව්‍යාපෘතියට අවාසිදායක ලෙස බලපානු ඇත.

## 2.3 ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලැබී ඇති තොරතුරු වලට අනුව, ව්‍යාපෘතිය සඳහා රජයේ ඉඩම් කැබලි 406 ක් ඇතුළුව ඉඩම් කැබලි 1965 ක් අත්පත් කර ගැනීමට නියමිතය. කෙසේවෙතත්, වන්දි ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳ අවසන් තීරණයක් නොමැතිවීම හේතුවෙන්, ඉඩම් අත්පත් කර ගැනිමේ කටයුතු තවදුරටත් මන්දගාමීව පවතී. ඉඩම් අත්පත් කරගැනීම මත පොලී පිරිවැය වැඩි වීමට ගෙවීම් ප්‍රමාද වීම අහිතකර ලෙස බලපානු ඇත. | මාර්ගය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමේදී ප්‍රමාදයන් සිදු විය හැක. | වන්දි ගෙවීමේ ක්‍රමවේදය තීරණය කිරීම සඳහා මහාමාර්ග අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සඳහා සංදේශයක් සකස් කරමින් සිටී. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

## 2.4 සම්පත් ඌණ උපයෝජනය

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එයින් රු.මිලියන 49 ක් මහාමාර්ග අමාත්‍යාංශය විසින් වෙනත් ව්‍යාපෘති සඳහා මාරු කර තිබුණි. එමනිසා, රු.මිලියන 51 ක ශුද්ධ | මූල්‍ය කළමනාකරණ පිළිබඳ දුර්වල පාලනයන්. | 2019 වර්ෂය සඳහා ඉඩම් අත්පත් කරගැනීම සහ නැවත පදිංචි කිරීම සඳහා මුලික අයවැය ප්‍රතිපාදනය රු.මිලියන 100 කි. එයින්, රු.මිලියන 49 ක් අමාත්‍යාංශය වෙනත් | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීම සඳහා පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු අතර ඒ |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදන වලින් සියයට 87ක් නියෝජනය කරමින් රු.මිලියන 44.35 ක ප්‍රතිපාදන පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් නිසා උපයෝජනය කර තිබුණි. | ව්‍යාපෘති සඳහා මාරු කර ඇති අතර රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ වර්ෂය සඳහා ඉතිරිය රු.මිලියන 51 කි. කෙසේවෙතත්, එම මුදලින් සියයට 87ක් උපයෝජනය කර ඇති අතර එය රු.මිලියන 44.35 කි. ඉඩම් අත්පත් කර ගැනිමේ ක්‍රියාවලිය සඳහා වන්දි යෝජනා ක්‍රමය තීරණය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතියට සැලසුම් කල රු.මිලියන 51 දක්වා ළඟා වීමට නොහැකි විය. | අනුව ප්‍රතිපාදන ඉල්ලා සිටිය යුතුය. |